## ආර්ථික ගැටළු විසඳා ගැනීම

- රෝග තත්ත්වය නිසා වියදම් කළමණාකරණය කිරීම.
  - අවශ්‍ය නම් ඥාති, මිත්‍ර හා හිතවත් අයගේ සහය ලබාගන්න.
  - රජයෙන් ලබා දෙන සහනාධාර පිළිබඳ දැනුම්වත් වන්න.
  - සහන සත්කාර සේවා සපයන ස්වේච්ඡා ආයතන වල සහය ලබා ගන්න.
  - නිසි උපදෙස් ලබාගැනීම මඟින් අනවශ්‍ය ආර්ථික ගැටළු මගහරවා ගන්න.
- රැකියාව/ආදායම් පවත්වා ගැනීම.
  - රෝග තත්වය පිළිබඳ ලිඛිත තොරතුරු සපයා සහන ලබාගන්න.
  - රෝගියාට ස්වයං රැකියාවක නිරතවීමට හැකිනම් එයට අනුබල දෙන්න.
  - ගෘහාශ්‍රිත ව්‍යාපාර කිරීමට රාජ්‍ය/රාජ්‍ය නොවන සංවිධාන වල සහය ලබාගන්න.

## අධ්‍යාත්මික සුවය පවත්වාගෙන යාම

- ආගමික කටයුතු සඳහා දායක වීමට අපහසුතා ඇත්නම් එය මගහරවා ගැනීමට කටයුතු කරන්න.
  - ආගමික වතාවත් සඳහා සුදුසු ස්ථානයක් සකසා දෙන්න.
  - ගුවන් විදුලිය, රූපවාහිනිය, කැසට් පට මගින් ආගමික වැඩසටහන් ශ්‍රවණයට ඉඩ සලසා දෙන්න.

## උපදේශන සේවය ලබාගත හැකි රාජ්‍ය ආයතන

- උපකාරක සේවා මධ්‍යස්ථානය (මහරගම ජාතික පිළිකා ආයතනය.) 011 2842052
- පළාත් මහ රෝහල් ආශ්‍රිත පිළිකා ප්‍රතිකාර ඒකක.
- ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ උපදේශන සේවාව.

### සහන සත්කාර ස්වේච්ඡා ආයතන

- ශ්‍රී ලංකා පිළිකා සංගමය. (0112585879)
- පිළිකා සරණ සංගමය. (0113155229)
- මිතුරු වැල සහායක ජාලය. ( )
- සත්‍ය සායි සුව සෙවන (0112687014)
- පිළිකා සුව සරණ සාධු සමාජය - ගම්පහ (0714450147,0714454788)
- කේන්(Cancer Aid North & East)
- සහන සුව 011 7600444

### පිළිකා ආධාර අයදුම් කිරීමේ ක්‍රමය

- ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් අයැදුම් පත්‍රය ලබාගන්න. නිසි පරිදි සම්පූර්ණ කල අයදුම් පත්‍රය පහත වාර්තා සමඟ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සමාජ සේවා නිලධාරි වෙත භාර දෙන්න. (සම්පූර්ණ දීමනාව රු. 500/- ක උපරිමයකට යටත් වේ.)
  - අඩු ආදායම් ලාභියකු බවට (මාසික ආදායම රු. 6000/- ට අඩු) ග්‍රාම සේවක විසින් සහතික කරන ලද වාර්තාවක් ලබා ගන්න.
  - රජයේ රෝහලක පිළිකා රෝග විශේෂඥ වෛද්‍යවරයකු විසින් සනාථ කරන ලද වෛද්‍ය වාර්තාවක් ලබාගන්න. (වාර්තාව නියමිත ආකෘතියට අනුව සකසා තිබිය යුතුය)

ඔබගේ වෛද්‍යමය කායික ගැටළු සම්බන්ධව උපදෙස් හා උපකාර ලබාගැනීමට ඔබේ පවුලේ වෛද්‍යවරයා, ළඟම ඇති රජයේ රෝහල හෝ අවශ්‍ය අවස්ථාවන්හි ඔබේ රෝගියාට ප්‍රතිකාර කරන පිළිකා සායනයට යොමුවන්න.

රෝගියා රැකබලා ගැනීමේ සමාජීය මූල්‍යමය හෝ වෙනත් ගැටළු සම්බන්ධව ඔබේ ප්‍රදේශයේ පහත නිලධාරීන් හමුවී උපදෙස් ලබා ගැනීම වැදගත් වේ.

- පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී<br>මහජන සෞඛ්‍ය පරීක්ෂක<br>මහජන සෞඛ්‍ය හෙද සොහොයුරිය<br>සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී තුමා
- ග්‍රාම නිලධාරී<br>ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සමාජ සේවා නිලධාරී

**ජාතික පිළිකා මර්දන වැඩසටහන**
**සෞඛ්‍ය අමාත්‍යාංශය**

ජාතික පිළිකා මර්දන වැඩසටහන
555/5, ඇල්විටිගල මාවත, නාරාහේන්පිට, කොළඹ-05
දුරකථන : 0112368627/0113159227
ක්ෂණික ඇමතුම් : 071 5320320

පිළිකා රෝගීන්ගේ පවුලේ අය හා රැක බලාගන්නන් සඳහා
ජාතික පිළිකා මර්දන වැඩසටහන මගින් බෙදාහරින අත්පත්‍රිකාවකි

# පිළිකා වැළඳුනු අයෙකු වෙනුවෙන් ඔබට කළ හැකි දේ බොහෝය



පිළිකාව ඕනෑම කෙනෙකුට වැළඳිය හැකි රෝගයකි.
දැනුවත් වී කලින් හඳුනාගැනීමෙන් පිළිකාව සුවකිරීමේ හැකියාව වැඩිවේ

පිළිකාව බෝ නොවන රෝගයකි.
එම නිසා බියනොවන්න

අවශ්‍ය ප්‍රතිකාර නොපමාව ලබා ගැනීම සඳහා පිළිකා පිළිබඳ විශේෂඥ වෛද්‍යවරයකු විසින් නිර්දේශ කරන ප්‍රතිකාර ක්‍රම නිසි පරිදි නොකඩවා පිළිපදින්න

වේදනාව හා අනෙකුත් ශාරීරික හා මානසික අපහසුතාවයන් සමනය කර ගැනීමට වෛද්‍ය උපදෙස් අනුව සහය වන්න